**ගොවිජන සංවර්ධන අරමුදල - 2013**

**-----------------------------------------**

ගොවිජන සංවර්ධන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 97(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක
සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි .

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1** **පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදලේ මුදල් ශේෂය භාණ්ඩාගාර පොත් සමඟ සැසඳීමේදී රු.651,797ක වෙනසක් වර්ෂ 6 කට වැඩි කාලයක සිට පවතින අතර, මෙම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට 2014 මාර්තු 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ට්‍රැක්ටර් ට්‍රේලර් ණය ගිණුමේ ශේෂය හා ආයතන සංවර්ධන අංශයෙන් ලබාදී ඇති උපලේඛනයේ ශේෂය අතර රු.53,491 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.2** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) "ජපන් යෙන් ආධාර වැඩසටහන" යටතේ ගොවි කමිටු හා ගොවි සමිති වෙත අමාත්‍යාංශය බෙදාදුන් කෘෂි උපකරණ සඳහා වාරික වශයෙන් අයකර ගෙන කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යැවිය යුතු වේ. සමාලෝචිත වර්ෂය තුළ වාරික ලෙස රු.70,761,153 ක් රැස්කරගෙන තිබූ නමුත් ප්‍රේෂණය කර ඇති මුදල රු.68,221,464 ක් විය.

(ආ) ඉසින යන්ත්‍ර තැන්පත් හා බුල්ඩෝසර් සේවා තැන්පත් ගිණුම්වල රු.10,746,805 ක ශේෂ වර්ෂ 07 කට වැඩි කාලයක සිට නිරවුල් නොකර ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ලැබිය යුතු ගිණුම්වල රු.6,859,216 ක අක්‍රීය ණය ශේෂයන් නිරීක්ෂණය වූ අතර, වර්ෂ 07 ක පමණ සිට පැවත එන මෙම ණය ශේෂ අයකර ගැනීම සඳහා සක්‍රීය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.3** **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 | මූල්‍ය ප්‍රකාශන අනුව 2006 වර්ෂයට පෙර හඳුනාගත් |

| | | |
|---|---|---|
| | | තොග ඌනතාවය රු.450,000 ක්වූ අතර ඒ පිළිබඳ වගකිව යුත්තන් නිශ්චය කර අයකර ගැනීමට කටයුතු කිරීම වෙනුවට දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල තොග ඌනතාවය ලෙස දක්වා තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | එක් අවස්ථාවකදී ලබාදිය හැකි තත්කාර්ය අතුරු අග්‍රිමයක් රු.20,000 ට වැඩි නොවිය යුතු වුවත්, එම සීමාව ඉක්මවා අවස්ථා 11 කදී එකතුව රු.4,181,076 ක් ගෙවා තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 371(2)(ඇ) | ව්‍යාපෘති 05 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුල ලබා දී තිබූ එකතුව රු.808,231 ක අත්තිකාරම් මුදලින් අදාල සම්පූර්ණ කාර්යය ඉටුනොකර හා සියයට 25 ක පමණ කාර්යයන් ඉටුකර එකතුව රු.717,685 ක මුදලක් සමාලෝචිත වර්ෂය අගදී පියවා තිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4(1) (ඇ) වගන්තිය | අනුමත කරන ලද අයවැය ඇස්තමේන්තුවකින් තොරව අදාල වර්ෂයේදී වියදමක් නොදැරිය යුතු වුවද ඊට පටහැනිව අනුමත නොවූ කාර්යයන් 13 ක් සඳහා රු.4,676,187 ක වියදමක් දරා තිබීම. |

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,827,826 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,492,719 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,335,107 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි අක්කර බදු ආදායම රු.7,455,026 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------

ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ අමාත්‍යාංශය විසින් එක් එක් වර්ෂවල බෙදාදුන් ට්‍රැක්ටර් සහ වතුර පොම්ප සඳහා වාරික අයකර ගැනීම අරමුදලේ වගකීමක් වුවද අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති අතර, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට හිඟ වාරික මුදල රු.521,789,207 ක් විය.

**4.2 ඌන උපයෝජිත වත්කම්**

------------------------------

2010/2011 වර්ෂවල රු.8,227,329 ක් වියදම්කර ජලධාරා අත්පොත්, ජලධාරා ඇල්බම්, ගම්බද වාරිමාර්ග අත්පොත් මුද්‍රණය කර තිබුණද, එම පොත් අදාල පාර්ශව වෙත බෙදාහැරීම ඉතා සෙමින් සිදුවන බව නිරීක්ෂණය වූ අතර, මුද්‍රණය කර තිබූ පොත් 41,300 කින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පොත් 37,039 ක් ඉතිරිව තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ සංවර්ධන කාර්යයන් 06 ක් සඳහා වෙන්කළ රු.3,100,000 ක ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම් හා තොග ලේඛන පවත්වාගෙන යාම

(ආ) තැන්පතු ගිණුම් නිරවුල් කිරීම

(ඇ) ණය අයකර ගැනීම

(ඈ) වත්කම් උපයෝජනය

(ඉ) අත්තිකාරම් ලබාදීම